**unit 01**

වාගීෂ්වර

**Part 04**

# දේශපාලන විද්‍යාවේ ස්වභාවය

- දේශපාලන විද්‍යාවේ විද්‍යාත්මකභාවය
- දේශපාලන විද්‍යාව අනෙකුත් සමාජ විද්‍යාවන් සමග ඇති සම්බන්ධය

s u r e k a   w a g e e s h w a r a

# දේශපාලනය විද්‍යාවේ විද්‍යාත්මකභාවය

# දේශපාලන විද්‍යාවේ විද්‍යාත්මක භාවය

**දේශපාලන විද්‍යාව විද්‍යාවක්ද? ( විද්‍යාවක් වේ / නොවේ)**

<u>ප්‍රවේශය</u>

- **<u>දේශපාලන විද්‍යාව කෙටියෙන් හඳුන්වන්න.</u>**
  (සාමාජීය විද්‍යාවත් බව , පදයේ බිහිවීම , නිර්මාතෘවරයා , යුග , බිහිවූයේකුමක් සඳහාද . . . .)

- **<u>විද්‍යාවක් යනු කුමක්දැයි දක්වන්න.</u>**

**පොදු නිර්වචන**

''විද්‍යාවක් යනු ,යම් විෂයක් පිළිබඳ නිරීක්ෂණය මගින් ලබා ගන්නා දැනුම් සම්භාරය අවසාන වශයෙන් ද්‍රව්‍යාත්මක මාර්ගයෙන් ඔප්පු කිරිමට හැකි තත්වයකි. ''

**දාර්ශනික නිර්වචන**

''යම් විෂයක් පිළිබද අදාල තත්වයන් එකට ගළපමින් ,වර්ග කරමින් නිරීක්ෂණය කරමින් අවසාන වශයෙන් ලබා ගන්නා දැනුම් සම්භාරය විද්‍යාවක් වේ.

-මහාආචාර්ය ගානර්-

- **<u>දේශපාලන විද්‍යාව අදාල වන්නේ කුමන විද්‍යා කාණ්ඩයටද?</u>**

විද්‍යාවන්

1. ස්වභාවික විද්‍යාවන්
(ශුද්ධ විද්‍යාවන්)

උදා - භෞතික විද්‍යාව
රසායනික විද්‍යාව
ජීව විද්‍යාව

2. සමාජීය විද්‍යාවන්
(මානව ශාස්ත්‍ර විද්‍යාවන්)

උදා - දේශපාලන විද්‍යාව,ආර්ථික විද්‍යාව
සමාජ විද්‍යාව , මනෝ විද්‍යාව ,
දර්ශනය , තර්ක ශාස්ත්‍රය , නීතිය
ඉතිහාසය

<u>කරුණු</u>

මිනිසාගේ දේශපාලන චර්යාවන් හා අන්තර් ක්‍රියාකාරකම් අධ්‍යයනය කරනු ලබන සමාජීය විද්‍යාවක් (social science) වන දේශපාලන විද්‍යාවේ විද්‍යාත්මකභාවය ස්වභාවික විද්‍යාවන් ට සාපේක්ෂව අඩුය. එම නිසා දේශපාලන විද්‍යාවේ විද්‍යාත්මක භාවය සම්බන්ධයෙන් ප්‍රධාන සංවාද (කතිකාවන්,මත ) දෙකක් නිර්මාණයවී තිබෙයි.

01. දේශපාලන විද්‍යාව විද්‍යාවක් <u>නොවේ</u>.

02. දේශපාලන විද්‍යාව විද්‍යාවක් <u>වේ</u>.

## 01. දේශපාලන විද්‍යාව විද්‍යාවක් නොවේ.

හැඳින්වීම

දේශපාලන විද්‍යාවේ විද්‍යාත්මක භාවය සම්බන්ධයෙන් පළවී ඇති ප්‍රධානතම මතයක් වන්නේ, දේශපාලන විද්‍යාව විද්‍යාවක් නොවන බවයි. **දේශපාලන විද්‍යාව විද්‍යාවක් නොවන බව තහවුරු කිරීම සඳහා භාවිතා කළ හැකි මූලාශ්‍ර දෙකකි.**

(i) දර්ශනිකයන්ගේ අර්ථකථන

(ii) විද්‍යාවක් සතු ලක්ෂණ

මූලාශ්‍ර

### (i) දර්ශනිකයන්ගේ අර්ථකථන මත පදනම් වී දේශපාලන විද්‍යාවක් නොවන බව සනාථ කිරීම.

**ඔගස්ට් කොම්ට් , ඒඩ්මන් බර්ග් , මෙට්ලන්ඩ්** වැනි දේශපාලන විද්‍යාඥයින් දේශපාලන විද්‍යාව විද්‍යාවක් නොවේය යන මතය තහවුරු කරයි.

"ඔගස්ට් කොම්ට්ගේ" අර්ථකතනය

ඔගස්ට් කොම්ට් ප්‍රංශ ජාතිකයෙකි. සමාජ විද්‍යාවේ නිර්මාතෘවරයා ය. කොම්ට් ස්වාභාවික විද්‍යාවන් ගේ මූල ධර්ම, විද්‍යාත්මක ශිල්පීය ක්‍රම සමාජීය විද්‍යාවන් හැදෑරීම සඳහා යොදා ගැනීමට උත්සහගත් දාර්ශනිකයෙකි. ස්වභාවික විද්‍යාවන් හි මූල ධර්ම , විධික්‍රම , මත පදනම් වී ඔගස්ට් කොම්ට් දේශපාලන විද්‍යාව විද්‍යාවක් නොවන බව තහවුරු කිරීමට හේතු තුනක් පෙන්වා දෙයි.

**A** විෂය වර්ධනය පිළිබඳ ඒකීය භාවයක් නොමැති වීම.
**B** නිවැරදි භාවය ඉහළ මට්ටමක ඇති නියතීන් ගොඩනැගීමට අපහසු වීම.
**C** විධික්‍රම භාවිතා කරන මූල ධර්ම හා අවසාන නිගමන අතර පොදු එකඟතාවක් නොමැති වීම.

"එඩ්මන් බර්ග් " ගේ අර්ථ කථනය

**"ලලිත කලා අධ්‍යයනය තුළ දැකිය හැකි විද්‍යාවට වැඩිමනක් යමක් දේශපාලන විද්‍යාව තුළ විද්‍යාවක් වශයෙන් දැකිය නොහැකි ය. ගණිත ශාස්ත්‍රය තුළ අඳින්නා වූ ආකාරයේ ඍජු රේඛාවක් දේශපාලන විද්‍යාව තුළ ඇඳිය නොහැකි අතර දේශපාලන ඥාණය සම්බන්ධයෙන් නිශ්චිත සීමාවක් දැක්විය නොහැක. එමෙන්ම දේශපාලන විද්‍යාවේ සලකා බලන කරුණු සඳහා නිශ්චිත නිර්වචන ද සැපයිය නොහැක."**

"මෙට්ලන්ඩ්" ගේ අර්ථකතනය

**"දේශපාලන විද්‍යාව යන මාතෘකාව යටතේ හොඳ විභාග ප්‍රශ්න මාලාවක් මා දකින විට කණගාටු සිතෙන්නේ අසා ඇති ප්‍රශ්න පිළිබඳව නොව එහි මාතෘකා පිළිබඳව ය."**

ඉහත ආකාරයට ඔගස්ට් කොම්ට් , එඩ්මන් බර්ග්, මෙට්ලන්ඩ් වැනි දාර්ශනිකයන්ගේ මතවාද මත පදනම් වී දේශපාලන විද්‍යාව විද්‍යාවක් නොවන බව සනාථ කළ හැකිය.

**(ii) <u>විද්‍යාවක් සතු ලක්ෂණ දේශපාලන විද්‍යාව තුළ නොමැති නිසා දේශපාලන විද්‍යාව විද්‍යාවක් නොවන බව සනාථ කළ හැකිය.</u>**

- **මූල ධර්ම හා විධි ක්‍රම අතර ඒකීය භාවයක් නොමැති වීම.**

විද්‍යාවක තිබිය යුතු මූලික ලක්ෂණයක් වන්නේ විධි ක්‍රම හා මූල ධර්ම අතර ඒකීය භාවයක් පැවතීමයි. නමුත් දේශපාලන විද්‍යාව තුළ විධි ක්‍රම හා මූල ධර්ම අතර ඒකීය භාවයක් නොමැත.

**නිදර්ශන :-** ශුද්ධ ගණිතය තුළ දී $2 + 2 = 4$ එකතු කර විට පිළිතුර හතර බව
රසායන විද්‍යාවේ දී $H_2 + O = H_2O$ ජලය නිර්මාණයවීම.

විශ්වව්‍යාප්ත මට්ටමින් ප්‍රත්‍යක්ෂ මූලික සාධක මත පිළිගත් සර්වලෝකී පොදු පිළිගැනීමක් පවතී.

නමුත් ,

දේශපාලන විද්‍යාව තුල ඒකාධිපති හා සමාජවාදී පාලන ක්‍රමයන්ට වඩා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය හොඳ පාලන ක්‍රමයක් ලෙස පිළිගනු ලැබුව ද එය ක්‍රියාවට නැංවීම සඳහා වඩා උචිත කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ද ජනාධිපති ආණ්ඩුක්‍රමයක් ද යන්න පොදු පිළිගැනීමක් එකඟතාවයක් නොමැත.

**නිදර්ශන :-** ජනාධිපති අපේක්ෂකයෙකු සඳහා ඉදිරිපත් වීමට සම්පූර්ණ කළ යුතු වයස අවු : 30 - අවු : 35 ද පොදු පිළිගැනීමක් නැත.

**නිදර්ශන :-** ඡන්ද බලය ප්‍රධානය කළ යුත්තේ අවු : 18 න් ද අවු : 21 ක් ද යන්න පොදු එකඟතාවක් නොමැති වීම.

**නිදර්ශන :-** දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම සඳහා භාවිතා කළ යුතු විධික්‍රම සම්බන්ධයෙන් පොදු එකඟතාවයක් නොමැතිවීම.

මෙම ආකාරයට ස්වාභාවික විද්‍යාවන් තුල මෙන් විධික්‍රම හා මුල ධර්ම අතර ඒකීය භාවයක් නොමැති නිසා දේශපාලන විද්‍යාව විද්‍යාවක් වශයෙන් සැළකිය නොහැක.

- **හේතු සාධක මත පිහිටා නිශ්චිත අනාවැකි පළ කිරීමට නෙහැකි වීම.**

විද්‍යාවක තිබිය යුතු ලක්ෂණයක් වන්නේ හේතු සාධක මත පිහිටා නිශ්චිත අනාවැකි පල කිරිමට හැකිවීමයි. දේශපාලන විද්‍යාව තුල හේතු සාධක මත පිහිටා නිශ්චිත අනාවැකි පළකලද ඒවා නිවැරදි වන ප්‍රමාණය අවප්‍රමාණ වේ.

**නිදර්ශන :** භෞතික විද්‍යාව තුල ඇති 'ගුරුත්වාකර්ශණය'ඉහළට දැමූ වස්තුවක් පොලවට පතිත විම. , නියමිත ලෙස ම පළ කල හැකි අනාවැකියකි. නමුත් දේශපාලන විද්‍යාව තුල හේතු සාධක මත පිහිටා නිශ්චිත අනාවැකි පළ කල කිරීම අපහසුය.

ස්වාභාවික විද්‍යාව තුල මෙන් දේශපාලන විද්‍යාව තුළ හේතු සාධක මත පිහිටා නිශ්චිත අනාවැකි පළකිරීමට නොහැකි නිසා දේශපාලන විද්‍යාව විද්‍යාවක් නොවන බවට සනාථ කල හැකිවේ.

- **නියතීන් ගොඩනැගීමට අපහසු වීම.**

විද්‍යාවක් සතු තවත් ලක්ෂණයක් වන්නේ නියතින් ගොඩනැගීමට හැකි වීමයි.නමුත් දේශපාලන විද්‍යාව තුළ නියතීන් ගොඩනැගිමට අපහසුය.

**නිදර්ශන :** ජලය ඉහළ සිට පහලට ගැලීම, අධික උෂ්ණත්වයේ දී ද්‍රව්‍ය ප්‍රසාරණය වීම, අධික ශීතලේ දී ද්‍රව්‍ය සංකෝචනය වීම, ගුරුත්වා කර්ෂණය, නිව්ටන්ගේ නියමයන් ආදිය වශයෙන් ස්වාභාවික විද්‍යා තුළ ස්ථිර නියතීන් පවතී. නමුත් දේශපාලන විද්‍යාව තුළ දී එවැනි නියතිවාද ගොඩ නැගීමට අපහසුය. මැතිවරණයක දී එම පක්ෂයේ සාමාජිකයන් එම පක්ෂයට ම ඡන්දය දෙනු ඇතැයි නිශ්චිත නියතීන් ගොඩ නැගිය නොහැකිය.

ස්වාභාවික විද්‍යාව තුල මෙන් නියතීන ගොඩ නැගීමට සමාජීය විද්‍යාවක් වන දේශපාලන විද්‍යාව තුල නොහැකිය. එම නිසා දේශපාලන විද්‍යාව විද්‍යාවක් නොවේ යැයි මත පලකල හැකි ය.

- **විද්‍යාත්මක හා තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිතයට ගැනීමට අපහසු වීම.**

විද්‍යාවක තිබිය යුතු ලක්ෂණයක් වන්නේ විද්‍යාත්මක හා තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිතයට ගැනීමයි. නමුත් දේශපාලන විද්‍යාව තුල විද්‍යාත්මක හා තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිතයට ගැනීම අපහසුය.

**නිදර්ශන :** ස්වාභාවික විද්‍යාවන් තුළ පර්යේෂණාගාර මට්ටමින් බීකර, රසායනික ද්‍රව්‍ය, අන්වීක්ෂ, පරිගණක භාවිතා කරමින් පර්යේෂණයන් පවත්වයි. නමුත් දේශපාලන විද්‍යාව තුල පර්යේෂණාගාරය වන්නේ සමාජයයි. අමුද්‍රව්‍ය වන්නේ මිනිසායි. එම අමුද්‍රව්‍ය වල විද්‍යාත්මක හා තාක්ෂණික ස්වභාවයක් නොමැත. ඒ තුළ අන්තර්ගත වන්නේ ගතික ස්වභාවයක් පමණි.

ස්වාභාවික විද්‍යාව තුල මෙන් විද්‍යාත්මක හා තාක්ෂණික ශිල්පීය ක්‍රම දේශපාලන විද්‍යාව තුල භාවිතා කළ නොහැකි ය. එම නිසා දේශපාලන විද්‍යාව විද්‍යාවක් නොවන බව ප්‍රත්‍යක්ෂ කළ හැකි ය.

ඉහත ආකාරයට '<u>දේශපාලන විද්‍යාව විද්‍යාවක් නොවේ</u>' ය යන මතය තහවුරු කළ හැකිය. විශේෂයෙන් ස්වාභාවික විද්‍යාවන් (ශුද්ධ විද්‍යාවන්) සමග සංසන්දනය කිරීමේදී දේශපාලන විද්‍යාව විද්‍යාවක් නොවන බව පැහැදිලි වේ.

## 02. දේශපාලන විද්‍යාව විද්‍යාවක් <u>වේ</u>.

<u>හැඳින්වීම</u>

දේශපාලන විද්‍යාවේ විද්‍යාත්මක භාවය සම්බන්ධයෙන් පල වී ඇති අනෙක් මතය වන්නේ දේශපාලන විද්‍යාව විද්‍යාවක් වන බවයි. දේශපාලන විද්‍යාව විද්‍යාවක් බව තහවුරු කිරීම සඳහා භාවිතා කළ හැකි මූලාශ්‍ර දෙකකි.

(i) **දර්ශනිකයන්ගේ අර්ථකථන**

(ii) **විද්‍යාවක් සතු ලක්ෂණ**

<u>මූලාශ්‍ර</u>

### (i) <u>දර්ශනිකයන්ගේ අර්ථකථන මත පදනම් වී දේශපාලන විද්‍යාවක් කිරීම.</u>

ඇරිස්ටෝටල්, ගානර්, ජීන් බොඩෑන්, තෝමස් හොබ්ස් , ඩයිසි , රූසෝ වැනි දේශපාලන විද්‍යාඥයින් දේශපාලන විද්‍යාව විද්‍යාවක් වේය යන මතය තහවුරු කරයි.

"මහාචාර්ය ගානර් " ගේ අර්ථකතනය

"දේශපාලන විද්‍යාව පිළිබඳව ස්වභාවික විද්‍යාවන් තුළ දැකිය හැකි ආකාරයේ පරිපූර්ණත්වයක් අපේක්ෂා කළ නොහැකි ය. එයට හේතුව දේශපාලන විද්‍යාව තුළ සලකා බලන තත්වයන් අතිශය සංකීර්ණ හා ගතික ස්වභාවයක් ගැනීමය. නමුත් දේශපාලන විද්‍යාව තුළ සමාජීය විද්‍යාවකට අදාළ විද්‍යාත්මක භාවය ගැබ්ව තිබේ."

"ඇරිස්ටෝටල්" ගේ අර්ථකතනය.

"දේශපාලන විද්‍යාව සියලු සමාජ විද්‍යාවන් අතුරින් පැරණිතම හා අග්‍රගන්‍යමය සමාජීය විද්‍යාව වේ."

"දේශපාලන විද්‍යාව ස්වාමි (අධිපති) විද්‍යාව වේ."

ඉහත ආකාරයට දාර්ශණික මතවාදයන් මත පදනම් වි දේශපාලන විද්‍යාව විද්‍යාවක් බව සනාථ කළ හැකි ය. විශේෂයෙන් සමාජීය විද්‍යාවක් වන බව ප්‍රත්‍යක්ෂ කළ හැකි ය.

**(ii) විද්‍යාවක් සතු ලක්ෂණ දේශපාලන විද්‍යාව තුළ පවතින නිසා දේශපාලන විද්‍යාව විද්‍යාවක් බව සනාථ කළ හැකිය.**

- විද්‍යාවක් සතු ලක්ෂණ කිහිපයකි.

1. දත්ත එකතු කිරීම.
2. දත්ත පෙළ ගැස්වීම.
3. දත්ත වර්ගීකරණය.
4. නැමියාව හඳුනාගැනීම.
5. නිගමන වලට එළඹීම.
6. නියතීන් ගොඩ නැගීම.
7. අනාවැකි පල කිරීම.

- දත්ත එකතු කිරීම.

දත්ත රාශිගතකරණය විද්‍යවක් සතු ප්‍රධාන ලක්ෂණයකි. එය දේශපාලන විද්‍යාව තුළ අන්තර්ගත වේ.

නිදර්ශන :

ඇරිස්ටෝටල් විසින් දේශපාලනය (Politics) කෘතිය රචනා කරනු ලැබුවේ ග්‍රීක පෞර රාජ්‍යයන් 158 ක් පිළිබඳ දත්ත එකතු කිරීමෙනි.

ෆෙඩ්රික් එංගල්ස් විසින් පවුල පෞද්ගලික දේපල හා රාජ්‍ය උපත කෘතිය රචනා කරනු ලැබුවේ ඓතිහාසික සමාජ පිළිබඳ දත්ත එකතු කිරීමෙනි.

බ්‍රයිස් සාමි වරයා විසින් නූතන ප්‍රජාතන්ත්‍රවාදය කෘතිය රචනා කරනු ලබන්නේ එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය ආදී රාජ්‍ය තුල සංක්‍රමණය කරමින් දත්ත එක් රැස් කිරීම හරහාය.

ඉහත ආකාරයට විද්‍යාවක ලක්ෂණයක් වන දත්ත එකතු කිරීම දේශපාලන විද්‍යාව තුල තිබෙන නිසා දේශපාලන විද්‍යාව විද්‍යාවක් ලෙස සනාථ කළ හැකි ය.

- **දත්ත වර්ගීකරණය**

දත්ත වර්ගීකරණය විද්‍යාවක් සතු ප්‍රධාන ලක්ෂණයකි. එය දේශපාලන විද්‍යාව තුළ අන්තර්ගත වේ.

**නිදර්ශන :**

දේශපාලන විද්‍යාව තුළ ඇති **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය** (ලිඛිත - අලිඛිත, නම්‍ය- අනම්‍ය , ඒකීය, සන්ධීය - සහසන්ධීය)

**ආණ්ඩුක්‍රම වර්ගීකරණය,**
( ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී - සමාජවාදී - ෆැසිස්ට්වාදී - සමාජ ප්‍රජාතන්ත්‍රවාදී )

**පක්ෂ වර්ගීකරණය,**
( ඒක පක්ෂ - බහු පක්ෂ - ද්වි පක්ෂ )

ඉහත ආකාරයට දත්ත වර්ගීකරණය දේශපාලන විද්‍යාව තුළ තිබෙන නිසා දේශපාලන විද්‍යාව විද්‍යාවක් ලෙස සැලකිය හැකි ය.

- **නියතීන් ගොඩනැගීම.**

නියතීන් ගොඩනැගීම විද්‍යාවක් සතු ප්‍රධාන ලක්ෂණයකි. එය දේශපාලන විද්‍යාව තුළ අන්තර්ගත වේ.

**නිදර්ශන :**

ඇරිස්ටෝටල් විසින් ඉදිරිපත් කළ නියතියක් වන්නේ **සෑම සමාජ විප්ලවයකට ම හේතුව සමාජ අසාධාරණයයි.**

ඇරිස්ටෝටල් ඉදිරිපත් කළ තවත් නියතියක් වන්නේ මිනිසුන් උපතින්ම ගෙන එන ආශාවන් තුනකි. ධනය **පිළිබඳ** ආශාව , බලය **පිළිබඳ** ආශාව, **ලිංගිකත්වය පිළිබඳ** ආශාව.

ඇක්ටන් **සාමි** වරයා, බලය **විසින් මිනිසා දූෂණය කරයි**, අධික **බලය** මිනිසා අත්‍යන්තයෙන්ම **දූෂණය කරයි.** යනුවෙන් නියතියක් ඉදිරිපත් කරයි.

ඉහත ආකාරයට දේශපාලන විද්‍යාව තුළ නියතින් ගොඩ නගා තිබෙයි. එමනිසා දේශපාලන විද්‍යාව විද්‍යාවක් ලෙස සැලකිය හැකි ය.

- **නිගමන වලට එළඹීම**

නිගමන වලට එළඹීම විද්‍යාවක් සතු ප්‍රධාන ලක්ෂණයකි. එය දේශපාලන විද්‍යාව තුළ අන්තර්ගත වේ.

**නිදර්ශන :**

"ෆැසිස්ට්වාදී ආණ්ඩුක්‍රම, සමාජවාදී ආණ්ඩු ක්‍රමයන්ට වඩා ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය යහපත් පාලන ක්‍රමයක් වේ."

"බලතල බෙදා හැරීම නිසා පුද්ගල නිදහස ආරක්ෂා වේ."

"විධායකයේ බල සංවරණය කළ යුතු ය"

"ජනාධිපති ආණ්ඩු ක්‍රමය කාර්යක්ෂමතාවයෙන් වැඩිය, ප්‍රජාතාන්ත්‍රික භාවයෙන් අඩුය. කැබිනට් ආණ්ඩුක්‍රමය කාර්යක්ෂමතාවයෙන් අඩුය ප්‍රජාතාන්ත්‍රික භාවයෙන් වැඩිය"

ඉහත ආකාරයට දේශපාලන විද්‍යාව තුළ එළඹ ඇති නිගමනයක් වේ. එම නිසා දේශපාලන විද්‍යාව විද්‍යාවක් ලෙස සැලකිය හැකිය.

- **අනාවැකි පල කිරීම.**

අනාවැකි පල කිරීම විද්‍යවක් සතු ප්‍රධාන ලක්ෂණයකි. එය දේශපාලන විද්‍යාව තුළ අන්තර්ගත වේ.

**නිදර්ශන :**

**"ඇමරිකානු ජනාධිපතිවරයා ලෙස තේරීපත්වන පුද්ගලයා පෙරාතුව දැනගත හැකි වීම."**

ඉහත ආකාරයට දේශපාලන විද්‍යාව තුළ අනාවැකි පල කල හැකි ය. එම නිසා දේශපාලන විද්‍යාව විද්‍යාවක් ලෙස සැලකිය හැකි ය.

- **පරීක්ෂණ සිදු කිරීම.**

පරීක්ෂණ සිදු කිරීම විද්‍යවක් සතු ප්‍රධාන ලක්ෂණයකි. එය දේශපාලන විද්‍යාව තුළ අන්තර්ගත වේ.

සමාජය නැමති පරීක්ෂණාගාරය තුල දේශපාලන විද්‍යාඥයින් විසින් පර්යේෂණයන් සිදු කරයි. නව ආණ්ඩු ක්‍රම, නීති, දේශපාලන ආයතන නිර්මාණය කරයි. ඒවා ජනතාව අනුමත කරන්නේ නම්, එකඟ වන්නේ නම් පර්යේෂණය සාර්ථකය. ජනතාව ප්‍රතික්ෂේප කරන්නේ නම් පරීක්ෂණය අසාර්ථකය.

- **නූතන විද්‍යාත්මක විධික්‍රම භාවිතය.**

දේශපාලන විද්‍යාව තුළ ඓතිහාසික, දාර්ශනික, තුලනාත්මක ආදී සාම්ප්‍රදායික විධික්‍රම ද, චර්යාවාදී, සංඛ්‍යා විද්‍යා, පද්ධති විශ්ලේෂණ , සමාජ විද්‍යා වැනි විද්‍යාත්මක භාවය ඉතා ඉහළ මට්ටමකින් ඇති නූතන විධික්‍රම භාවිතා කිරීම.

ඉහත ආකාරයට දේශපාලන විද්‍යාව විද්‍යාවක් වන බව දාර්ශනික අර්ථකතන තුලින් හා විද්‍යාවක් සතු ලක්ෂණ දේශපාලන විද්‍යාව තුළ පැවතීමෙන් පැහැදිලි වේ. විශේෂයෙන් දේශපාලන විද්‍යාව තුල ස්වභාවික විද්‍යාව තුල හඳුනාගත හැකි ආකාරයෙන් උසස් විද්‍යාත්මක භාවයක් දක්නට නොලැබුණ ද සමාජීය විද්‍යාවකට අදාළ විද්‍යාත්මක භාවය ඉතා ඉහළින් පවතින බව දේශපාලන විද්‍යාව විද්‍යාවක් වේය යන මතය පල කරන දේශපාලන විද්‍යාඥයන්ගේ අදහසයි.

## නිගමනය

**දේශපාලන විද්‍යාව විද්‍යාවක් වේ . . . . . . . . . .**

**දේශපාලන විද්‍යාව විද්‍යාවක් නොවේ. . . . . . . . . .**

මෙම දේශපාලන විද්‍යාවේ විද්‍යාත්මක භාවය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති මතවාද දෙකම තර්කානුකූලව නිවැරදි වේ.

දේශපාලන විද්‍යාව යනු සමාජීය විද්‍යාවකි. දේශපාලන විද්‍යාව මගින් අධ්‍යයනය කරනු ලබන්නේ සමාජය තුළ ජීවත්වන මිනිසාගේ විවිධ **දේශපාලන චර්යාවන් සහ දේශපාලනික අන්තර් ක්‍රියාකාරකම් ය.**

මානව චර්යාවන් පොදු ලක්ෂණ වන්නේ ඒවා අතිශයින් ම **අවිනිශ්චිත** , අතිශයින්ම **අස්ථාවර** , **ඒකීය භාවයෙන් තොර** ස්වරූපයක් දැරීමයි. එම නිසා මිනිස් හැසිරීම් යන මූලධාතූන් පදනම් කොට ගත් දේශපාලන විද්‍යාව කුමන විද්‍යාත්මක ක්‍රමවේදයන් මත පදනම්වී අධ්‍යයනය කළ ද එළඹිය හැක්කේ නිශ්චිත ස්ථාවර නිගමන වලට නොව **සාමාන්‍යකරණය කරන ලද** (සාමාන්‍ය) නිගමන වලටය.

ස්ථාවර නියති වාද හා සාමාන්‍යකරන කරන ලද අවසාන නිගමනය වූ කලී එකක් නොව එකිනෙකට වෙනස් දෙකකි. ස්ථාවර නියති වාද ගොඩ නගන්නේ හේතු ඵල වාදය පදනම් කොටගෙනය. සාමාන්‍ය කරනය කරන ලද නියති වාද ගොඩනගන්නේ සමාන මෙන්ම අසමාන තත්වයන් එකට ගෙන විශ්ලේෂණය කිරීමෙනි. එම නිසා ස්ථාවර නියතිවාද වලට පොදු විශ්විය ස්වරූපයක් පවතින අතර ස්වභාවික විද්‍යාවන් තුළ පවතින්නේ එවැනි තත්වයකි. සාමාන්‍යකරනය කරන ලද නියතිවාද තුල පොදු විශ්වීය ස්වභාවයක් නොමැත. සමාජීය විද්‍යාවන් තුල පවතින්නේ එවැනි තත්ත්වයක් ය. එම නිසා දේශපාලන විද්‍යාව සාමාන්‍යකරණය කරන ලද නියතිවාද, නිගමන , අනාවැකි  නිර්මාණය කළ හැකි සාමාජීය විද්‍යාවක් ලෙස හඳුනාගත හැකි ය.

# දේශපාලනය විද්‍යාව අනෙකුත් සමාජ විද්‍යාවන් සමඟ ඇති සම්බන්ධතාවය

# දේශපාලන විද්‍යාව අනෙකුත් සමාජව විද්‍යා සමඟ දක්වන සම්බන්ධතාවය . . . .

<u>ප්‍රවේශය</u>

- <u>දේශපාලන විද්‍යාව කෙටියෙන් හඳුන්වන්න.</u>
- <u>විද්‍යාවක් යනු කුමක්දැයි දක්වන්න.</u>
- <u>විද්‍යාවන් වර්ග දක්වන්න.</u>

<u>කරුණු</u>

**සමාජීය ( සමාජ ) විද්‍යාවක් යනු**

පොදු නිර්වචන ,

" සමාජය පිළිබඳ හදාරනු ලබන විද්‍යාවන් සමාජීය විද්‍යාවන් "වේ. වශයෙන් නිර්වචනය කළ හැකිය. මෙය සාදාජීය විද්‍යාවන් සම්බන්ධයෙන් පළවී ඇති ප්‍රාථමික හා ජනප්‍රිය තලයේ අර්ථනිරූපණයකි.

## තවදුරටත් ,

"සමාජයේ විවිධ අංශ විධිමත්ව හා ශාස්ත්‍රීය පදනමකින් අධ්‍යයනය කරනු ලබන විද්‍යාවන් සමාජයීය විද්‍යාවන් වේ."

" මානව සමාජය තුළ ජීවත් වන මිනිසුන්ගේ විවිධ මානව චර්යාවන් සහ සමාජ අන්තර් ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනය කරනු ලබන විද්‍යාවන් සමාජීය විද්‍යාවන් වේ."

"මිනිසුන් සහ ඔවුන්ගේ සමාජීය ජීවිතයේ විවිධ පැතිකඩවල් අධ්‍යනය කරනු ලබන විද්‍යාවන් සමාජීය විද්‍යාවන් වේ."

සමාජයේ විවිධ අංශ පැතිඩවල් අධ්‍යයනය කිරීමට සමාජ විද්‍යාවන් රාශියක් නිර්මාණය වී තිබෙයි. ඒ ඒ සමාජ විද්‍යාවන් මගින් අධ්‍යයනය කරනු ලබන්නේ සමාජය තුළ එක් එක් අංශයන් ය.

## ඒ අනුව ,

ආර්ථික විද්‍යාව මගින් ⟶ මිනිසා හා ධනය අතර ඇති සම්බන්ධතාවය සහ ආර්ථික ජීවියෙකු වශයෙන් මිනිසා ගේ චර්යාවන් හා අන්තර් ක්‍රියාකාරකම් අධ්‍යයනය

ආචාර විද්‍යාව මගින් ⟶ මිනිසාගේ සාමාජීය ජීවිතය සහ බැඳි හොඳ නරක , සාරධර්ම , සදාචාරය , හරි වැරදි , දුරාචාරය , සිරිත් විරිත් හා ආචාර ධර්ම පිළිබඳ අධ්‍යයනය.

| | | |
|---|---|---|
| දේශපාලන විද්‍යාව මගින් | → | දේශපාලන ජීවියෙකු වන මිනිසාගේ විවිධ දේශපාලන චර්යාවන් හා දේශපාලන අන්තර් ක්‍රියාකාරකම් අධ්‍යයනය කරනු ලබයි. |
| නීතිය මගින් | → | සමාජය තුළ ඇති "නීතිය" සම්බන්ධයෙන් අධ්‍යයනය කරනු ලබයි. |
| සමාජ විද්‍යාව මගින් | → | මිනිසා විසින් නිර්මාණය කරගෙන ඇති සමාජ සංවිධාන , මිනිසාගේ සමාජ ජීවිතය හා බැඳි පවතින සම්ප්‍රදායන් , විශ්වාස සිරිත් විරිත් සම්බන්ධයෙන් අධ්‍යයනය කරනු ලබයි. |
| මනෝ විද්‍යාව මගින් | → | මිනිසුන්ගේ මානසික තත්වයන් එම තත්වයන් නිර්මාණයවීමට සමාජයමය සාධක බලපානු ලබන ආකාරය අධ්‍යයනය කිරීම. |
| භූගෝල විද්‍යාව මගින් | → | මිනිසා ජීවත්වන පරිසරය සම්බන්ධයෙන් අධ්‍යයනය කරයි. |
| ඉතිහාසය මගින් | → | මිනිසාගේ ඓතිහාසික තොරතුරු , සමාජ ඓතිහාසික තොරතුරු අධ්‍යයනය |

<u>සමාජ විද්‍යාව සතු ලක්ෂණ</u>

සමාජ විද්‍යාව යනු කුමක්දැයි තවදුරටත් හඳුනා ගැනීම සඳහා <u>සාමාජීය විද්‍යාවන් සතු ලක්ෂණ</u> ද වැදත් වේ.

- සමාජය නැමැති විද්‍යාගාරය මත පදනම් වී පර්යේෂණ සිදු කිරීම.
- මානව චර්යාවන් සහ අන්තර් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම.
- හේතු සාධක මත පිහිටා නිශ්චිත අනාවැකි පළ කිරීමට අපහසු වීම.
- විද්‍යාත්මක හා තාක්ෂණික ශිල්පීය ක්‍රම යොදාගැනීමට අපහසු වීම.
- සියයට සියයක් නිවැරදි අනාවැකි පළකිරීමට අපහසුවීම.
- භාවිතා කරන මූලධර්ම හා නිගමන අතර පොදු එකගතාවක් නොමැතිවීම.
- උපකල්පන බහුලවීම.
- විෂය වර්ධනය පිළිබඳ ඒකීය භාවයක් නොමැති වීම.

## දේශපාලන විද්‍යාව හා අනෙක් සාමාජීය විද්‍යාවන් අතර ඇති සම්බන්ධතාවය

<u>හැඳින්වීම -</u>

දේශපාලන විද්‍යාව සමාජීය විද්‍යාවක් වේ. එය සමාජයේ ඇති දේශපාලන අංශය සම්බන්ධයෙන් අධ්‍යයනය කරනු ලබන විද්‍යාවයි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් මිනිසුන්ගේ දේශපාලන චර්යාවන් හා දේශපාලනික අන්තර් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අධ්‍යයනය කරනු ලබන ශාස්ත්‍රීය විෂය දේශපාලන විද්‍යාව වේ.

දේශපාලන විද්‍යාවේ පියා වන ඇරිස්ටෝටල්ට අනුව ,

> **"දේශපාලන විද්‍යාව යනු සියළු සාමාජීය විද්‍යාවන් අතුරින් පැරණිතම හා අග්‍රගන්‍යමය සාමාජීය විද්‍යාව වේ."**
>
> **"දේශපාලන විද්‍යාව අධිපති විද්‍යාව වේ. "**( Master Science)
>
> **"දේශපාලන විද්‍යාව පීතෘ විද්‍යාවේ."**
>
> -ඇරිස්ටෝටල්-

සාමාජීය විද්‍යාවක් වන දේශපාලන විද්‍යාව ඉතිහාසය , ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව , ආචාර විද්‍යාව , මානසික විද්‍යාව , නීතිය දර්ශනය , භූගෝල විද්‍යාව වැනි සාමාජීය විද්‍යාවන් සමඟ අන්තර් පෝෂණයක් පවතී. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් දේශපාලන විද්‍යාව සහ අනෙකුත් සාමාජීය විද්‍යාවන් අතර අන්තර් සම්බන්ධතාවයක් පවතී. මින්? පැහැදිලි වන්නේ දේශපාලන විද්‍යාව සාමාජීය විද්‍යා පවුලට අයත්වන බවයි.

### 01. ආර්ථික විද්‍යාව

ආර්ථික විද්‍යාව සහ දේශපාලන විද්‍යාව අතර අති සමීප සම්බන්ධතාවයක් පවතී.

- **විෂයානුබද්ධව ඇති සම්බන්ධතාවය ,**

**1.1 ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව තුළ බිහිවීම.**

ආර්ථික විද්‍යාව උත්පාද වන්නේ දේශපාලන විද්‍යාව තුලයි. මෑතක් වන තුරුම (1778) ආර්ථික විද්‍යා විෂය කොටස් පැවතියේ දේශපාලන විද්‍යාවේ විෂය කොටස් ලෙසය. වර්තමානය තුළ ආර්ථික විද්‍යාව වෙනම විෂයක් ලෙස වර්ධනය වන අතර ඒ තුළ <u>"දේශපාලන ආර්ථික විද්‍යාව"</u> (Political Economics ) ලෙස අනු විෂය කාණ්ඩයක් නිර්මාණය වී තිබේ.

**1.2 මාතෘකා අතර ඇති සමාන භාවය.**

නිදර්ශන - සමාජ වාදය , ධන වාදය විෂය දෙක තුළම සාකච්ඡා කිරීම.

**1.3 දාර්ශනිකයන් අතර ඇති සමාන භාවය.**

නිදර්ශන - කාල් මාක්ස් , ඇඩම් ස්මිත් විෂය දෙක තුළම මුණ ගැසීම.

- **ප්‍රායෝගික තලයේදී ,**
  - රටක ආර්ථික ප්‍රතිපත්ති සකස් කරනු ලබන්නේ දේශපාලඥයින් ය.

    නිදර්ශන - රාජ්‍ය අය - වැය ලේඛනය, මුදල් අමාත්‍යවරයා නිර්මාණය කිරීම.

  - රාජ්‍ය ආර්ථික ක්‍රමය මත දේශපාලන ක්‍රමය තීරණය වීම.

    නිදර්ශන - ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රටක ධනවාදී ආර්ථිකයක් පැවතීම.
    සමාජවාදී රටක සමාජවාදී ආර්ථික ක්‍රමයක් පැවතීම.

  - රටක ආර්ථික අර්බුධය දේශපලනයට බලපෑම් කිරීම.

    නිදර්ශන - උද්දමනය

01. **ඩේවිඩ් ඊස්ටන්ගේ යෙදවුම් හා නිමැවුම් ක්‍රමය** ___________

1953 දී "<u>**දේශපාලන පද්ධතිය**</u>" කෘතිය මගින් මෙම විධි ක්‍රමය දේශපාලන විද්‍යාවට ඊස්ටන් විසින් එකතු කරයි. දේශපාලන සමාජයක් තුළ දේශපාලන පද්ධතියක් ක්‍රියාත්මක වෙයි. මෙම <u>**දේශපාලන පද්ධතිය මත පදනම් වී යෙදවුම් හා නිමැවුම් තීරණය කරන ක්‍රියාවලිය යෙදවුම් හා නිමැවුම් ක්‍රමය ලෙස සරලව හැඳින්විය හැකිය.**</u> දේශපාලන පද්ධතියට සමාජය විසින් යෙදවුම් ඉදිරිපත් කරයි. මෙහි යෙදවුම් යනුවෙන් අදහස් කරනු ලබන්නේ ඉල්ලීම් හා සහයෝගය දැක්වීමය. නිමැවුම් යනු ආණ්ඩුවේ තීරණ හා ප්‍රතිපත්තීන් ය. යෙදවුම් හා නිමැවුම් අතර සම්බන්ධතාවය නිර්මාණ කරනු ලබන්නේ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය මගිනි.




02. **ගබ්රියල් ආමන්ඩ්ගේ ව්‍යූහ කෘත්‍ය විශ්ලේෂණ ක්‍රමය** ___________

1960 ගණන් වලදී මෙම විධි ක්‍රමය නිර්මාණය විය. <u>දේශපාලන ව්‍යූහය සහ ව්‍යූහයේ අවයවයන්ට පැවරුණු කාර්යයන් එම අවයවයන් අතර ඇති සම්බන්දතාවය , අධ්‍යයනය කිරීම මගින් නිගමන වලට එළඹීම</u> ව්‍යූහකෘත්‍ය විශ්ලේෂණ ක්‍රමය යි.

<u>පද්ධති විශ්ලේෂණ විධික්‍රමයේ වාසි අවාසි</u>

පද්ධති විශ්ලේෂණ විධික්‍රමයට අදාළව හඳුනාගත හැකි වාසි - අවාසි සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.

වාසි (වැදගත්කම්)

- දේශපාලන පද්ධතිය අධ්‍යනය කිරීම මෙම ක්‍රමයේ වාසියකි.
- දේශපාලන පද්ධතිය හැදෑරීම මගින් යෙදවුම් හා නිමැවුම් හඳුනා ගැනීමට හැකිවීම.
- දේශපාලන පද්ධතිය අධ්‍යනය මගින් එළඹෙන නිගමන වල නිවැරදිභාවය ඉහළ අගයක පැවතීම.
- දේශපාලන පද්ධතිය හා එය ක්‍රියාත්මක වන සමාජය අතර ඇති සමීප සබඳතාවය අධ්‍යනය කිරීමට හැකිවීම.

අවාසි (දුර්වලතා)

- දේශපාලන පද්ධතිය සමාජයෙන් සමාජයට වෙනස්වීම.
- දේශපාලන පද්ධතිය අධ්‍යයනය කිරීම මගින් ලබාගන්නා නිගමන පොදුවේ සර්වලෝකීය මට්ටමෙන් භාවිත කිරීමට නොහැකි වීම.

මේ ආකාරයට දේශපාලන විද්‍යාව අධ්‍යනය කිරීම සඳහා භාවිත කරන විධික්‍රම හඳුනාගත හැකිය. අනාගතය තුළද නව විධික්‍රමයන් දේශපාලන විද්‍යාවට එක්විය හැකි ය. මෙතෙක් භාවිතයට ගත් විධික්‍රම අතුරෙන් විද්‍යාත්මක භාවය ඉහළ අගයක ඇති විධික්‍රමය වන්නේ චර්යාවාදී විධික්‍රමය යි. සමාජීය විද්‍යාවක් වන දේශපාලන විද්‍යාව අධ්‍යනය කිරීම සඳහා භාවිතා කරනු ලබන්නේ සමාජයීය විද්‍යාවන් අධ්‍යනය කිරීම සඳහා භාවිතා කරනු ලබන විධික්‍රමය ය. එමගින් දේශපාලන විද්‍යාව සමාජීය විද්‍යාවක් බව ප්‍රත්‍යක්ෂ වෙයි. එම විධික්‍රම බොහෝ දුරට සිතා ගැනීමේ , අභ්‍යුපගමනය , උපකල්පන මත හෝ ප්‍රත්‍යක්ෂ මූලික සාධක මත හෝ එම දෙකෙහිම මිශ්‍රණය මගින් සමාන්‍යකරණය කරන ලද නිගමනයන්ට එළඹීම ලක්ෂණ කොට ගෙන පවතී.